7th International Conference of Multidisciplinary Approaches (iCMA), 2020
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# නව යෞවනයන්ගේ ලිංගික දැනුම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

සඳමිණි යූ.ඒ.එම්.

සමාජ විද්‍යා අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
madusandamini@gmail.com

**සාරසංක්ෂේපය**
ලිංගිකත්වය යනු මිනිසාගේ මූලික අවශ්‍යතාවයක් වන අතර නව යෞවනය මානව ලිංගික ජීවිතයේ සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි ය. ලිංගිකත්වය සහ නව යෞවනත්වය පිළිබඳ සැලකීමේ දී කායික සහ මානසික වශයෙන් විරුද්ධ ලිංගිකයන් කෙරෙහි ආකර්ෂණයක් ඇති වීමේ ප්‍රාරම්භක අවධිය සහ ප්‍රජනන ක්‍රියාකාරීත්වයට සූදානම් වන්නා වූ අවධිය වන නිසාත් නව යෞවනය සහ ලිංගිකත්වය අවියෝජනීය සම්බන්ධතාවයකින් යුතු වේ. මේ නිසා නව යෞවනයන්ට නිසියාකාර ලිංගික සමාජානුයෝජනයක් පැවතීම අතවශ්‍ය කරුණකි. ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටවල්වල ලිංගිකත්වය පිළිබඳ කතිකාවන් සඳහා එතරම් නම්‍යශීලී ප්‍රතිපත්තියක් අනුගමනය නො කිරීම දරුවන්ගේ ලිංගික දැනුම අවිධිමත් වීමට මෙන් ම ගබ්සාව වැනි මහා පරිමාණ සමාජ ගැටලු ඇති වීමට හේතු වී තිබේ. මෙම නව පර්යේෂණයේ මූලික පරමාර්ථය වන්නේ නව යෞවනයන්ගේ ලිංගික දැනුම කෙබඳු ද? යන්න අධ්‍යයනය කිරීම යි. මෙම පර්යේෂණයේ අරමුණු ලෙස නව යෞවනයන්ගේ ලිංගික දැනුම පිළිබඳ අධ්‍යයනය කිරිම, නව යෞවනයන් ලිංගිකත්වය පිළිබඳ දැනුම ලබා ගන්නා ආකාරය පිළිබඳ විමසා බැලීම, නව යෞවනයන්ගේ ලිංගිකත්වය පිළිබඳ ගැටලු මොනවා ද යන්න විමසා බැලීම සහ නව යෞවනයන් ලිංගික අරක්ෂණ උපක්‍රම පිළිබඳ ලබා ඇති දැනුවත්භාවය විමසා බැලීම ආදිය පෙන්වා දිය හැකි ය. මෙම පර්යේෂණයේ පර්යේෂණ විධික්‍රමය ලෙස සමීක්ෂණ විධික්‍රමය යටතේ ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතයට ගනු ලැබූ අතර එහි දී ගම්පහ දිස්ත්‍රික්කයේ කිරිබත්ගොඩ ප්‍රදේශයේ උසස් අධ්‍යාපන ආයතනයක වයස අවුරුදු 17 සහ 18 යන වයස් සීමාවන්ට අදාළ උසස් පෙළ හදාරන සිසු සිසුවියන් 30 දෙනෙකුගෙන් යුතු නියැදියක් භාවිතයට ගන්නා ලද අතර එය සමස්ත සංගහනයෙන් 10%කි. මෙම පර්යේෂණය මගින් අනාවරණය කරනු ලැබූ කරුණු වන්නේ නව යෞවන වියෙහි පසු වන ගැහැනු දරුවන්ගේ ලිංගික දැනුවත්භාවය පිරිමි දරුවන්ගේ දැනුවත්භාවයට වඩා අවම මට්ටමක පවතින බවත් අදාළ දෙපිරිස ම ස්වකීය ලිංගික දිශානතීන් පිළිබඳ ව දැනුවත්භාවයක් ලබා තිබුණ ද උපත් පාලනය වැනි ලිංගික ආරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ ව අවම වූ දැනුවත්භාවයක් ඇති බවත් ආදාළ නියැදියෙන් 88%ක් ලිංගික දැනුවත්භාවය ලබා ගන්නේ සමවයස් කණ්ඩායම් සහ සමාජ මාධ්‍ය මගින් බවත් පාසල හෝ පවුල තුළින් ලැබෙන ලිංගික දැනුම ඉතාමත් අවම මට්ටමක පවතින බවත් ය. මේ අනුව ශ්‍රී ලංකාවේ නව යෞවනයන්ගේ ලිංගික දැනුම තවදුරටත් විධිමත් ලෙස වර්ධනය විය යුතු මට්ටමක පවතින බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** නව යෞවනයන්, ලිංගිකත්වය, ලිංගික දිශානතිය, ලිංගික සමාජානුයෝජනය, ලිංගික දැනුම